# ශ්‍රී ල නි ප ගමනක අවසානය

ශ්‍රී ල නි පක්‍ෂය යනු සිංහලත්වයේ පක්‍ෂය යැයි අප කියන්නේ කවියකුගේ ඇසින් බලා විසිරුණු අදහසක් ප්‍රකාශකිරීමක් ලෙස නොව සංකල්පීය අදහසක් ඉදිරිපත්කිරීමක් ලෙස ය. දේශපාලන හෝ වෙනත් ශාස්ත්‍රීය සාකච්ඡාවක දී කවි අදහස් ප්‍රකාශකිරීම අපේ සම්ප්‍රදායේ ද නැති බව අප පළමුව තේරුම්ගත යුතු ය. බණ්ඩාරනායක මහතා 1951 දී ලිබරල් පක්‍ෂයක් ආරම්භකළ නමුදු 1955 පමණවන විට ඒ පක්‍ෂය රූපාන්තරකරණයකට හසු වී සිංහලත්වයේ පක්‍ෂය බවට පත්විය.

එහෙත් ඒ පක්‍ෂයට කිසි දිනෙක සිංහලත්වයේ දර්ශනයක් හෝ ප්‍රවාද හෝ නො වීය. එයට වරදකරුවා ඒ පක්‍ෂය හෝ පක්‍ෂය පිහිටුවූ අය නොවන බව කිවයුතු ය. එයට වරදකරු මෙරට බුද්ධිමතුන් යැයි හඳුන්වනු ලැබූ පිරිස ය. ජාතික මතවාද නිර්මානයකිරීමට නොහැකිවූ ඊනියා බුද්ධිමතුන්ට කළහැකි මගපෙන්වීමක් නො වීය. එහි ප්‍රතිඵලය වූයේ ශ්‍රී ල නි පක්‍ෂය බටහිර ලිබරල් හා මාක්ස්වාදී මතවාද අතර දෝලනය වීම ය. අද වන විට ශ්‍රී ල නි පක්‍ෂයෙහි මේ මතවාදවල යම් සංකලනයක් දැකිය හැකි ය.

මාක්ස්වාදීන්ට තම මතවාදයෙහි පිහිටා ශ්‍රී ල නි පක්‍ෂය යනු කුමක්දැයි අවබෝධකරගැනීමට නොහැකිවීම පුදුමයක් නො වෙයි. විඥානයක් නැති පංතියක් ගැන කතාකරන මාක්ස්වාදයට ශ්‍රී ල නි පක්‍ෂයේ ඊනියා පංති ස්වභාවය හඳුනාගත නො හැකි ය. එයට හේතුව ශ්‍රී ල නි පක්‍ෂය තබා මාක්ස්වාදී පක්‍ෂවත් ඊනියා පංතියක පක්‍ෂ නො වීම ය. පංතිය යනු මාක්ස්ගේ පොත්වල ඇති මනඃකල්පිතයක් පමණකි. කම්කරු පංතියට පංති විඥානය පිටතින් ගෙනා යුතු යැයි උගන්වන මතවාදයක් පයේ සුළැඟිල්ලෙන් ඉහළට ගතයුතු වුවක් නො වෙයි. විඥානය නැතිව බිහිවන පංතිය ගැන කවර කතා ද?

මේ බංකොලොත් මාක්ස්වාදයෙහි අල්තූසර්ගෙන් පසුව යොදාගන්නා අධිනිශ්චය (ඕවර් ඩිටර්මිනේෂන්) යන බොරු සංකල්පය සලකන්න. අද ඊනියා ප්‍රබුද්ධයන් ඉවක් බවක් නොමැතිව යොදාගන්නා මේ වචනයෙහි තේරුමවත් මේ කසිකබල් ප්‍රබුද්ධයෝ දනිත් ද? මේ වචනයෙන් කියැවෙන්නේ මාක්ස්වාදයට තම බංකොලොත්බව පිළිගැනීමට ඇති නො හැකියාව ය. පංතිය යන සංකල්පය ආශ්‍රිතව සමාජයේ බොහෝ දේ තේරුම්ගැනීමට නොහැකි බව හැඟුණු විට, සමාජය වෙනත් සංකල්ප ආශ්‍රිතව තේරුම්කර දෙන විට, ඒ වෙනත් සංකල්ප අධිනිශ්චය වී ඇතැයි යන්න අල්තූසර්ගේ මාක්ස්වාදය ඔස්සේ යමකුට ඉගෙනගත හැකි පාඩම ය.

ජාතිය යන්න අධිනිශ්චය වී ඇතැයි කියන්නේ සමාජය පංතිය යන සංකල්පය ඇසුරෙන් නොව ජාතිය යන සංකල්පය ඇසුරෙන් බොහෝවිට විස්තර කළ හැකි බව තේරුම් ගැනීමෙන් පසුව ද ඒ බව නොපිළිගන්නා මාක්ස්වාදීන් ය. බටහිර භෞතික විද්‍යාව පසුපස යන මාක්ස්වාදීහු බටහිර භෞතික විද්‍යාඥයකු කිසි දිනෙක මෙවැනි කුණුහරුපයක් යොදා නොගන්නා බව නො දනිති. බටහිර භෞතික විද්‍යාඥයකු විද්‍යුතය යන සංකල්පය අහක දැමිය යුතු තැන්වල දී එය රැකගැනීම සඳහා මෙතන විද්‍යුතය ඇත එහෙත් වෙනත් මොකක්දෝ අධිනිශ්චය වී ඇතැයි කියන්නේ නැත.

මා මෙලෙස කී විට කසිකබල් ප්‍රබුද්ධයකු බටහිර භෞතික විද්‍යාවේ ක්‍රම වේදය සමාජ විද්‍යාවන්හි යොදාගත නොහැකි යැයි නන්දොඩවනු ඇත. මට බටහිර භෞතික විද්‍යාවවත්, බටහිර ගණිතයවත්, බටහිර සමාජ විද්‍යාවවත්, දැනුමෙහි කෝඩුව නො වෙයි. පසුගිය දා එක් කසිකබලකු කියා තිබුණේ මා බුදුදහම බටහිර ගණිතය ඇසුරෙන් බලන බව ය. දැනට අවුරුදු විස්සකට ආසන්න කාලයක් තිස්සේ මා ලියා ඇත්තේ බුදුදහම ඕල්කට් බෞද්ධයන්ගෙන් හා ඔවුන් විසින් ඇගයෙන බටහිර ගණිතයෙන් හා බටහිර විද්‍යාවෙන් ගලවාගැනීම පිළිබඳව ය. ඒ ලිපි තේරුම් ගැනීමට නොහැකි කසිකබල්ලු ජනතාවට කියාදීමට ඉදිරිපත්වෙති!

මා ඉහත සඳහන් අයුරින් ප්‍රකාශකරන්නේ මුළු මහත් බටහිර දැනුම ම බටහිර භෞතික විද්‍යාව පසුපස යෑමට වලිකන බැවින් මිස වෙනත් හේතුවක් නිසා නො වෙයි. කෙසේ වෙතත් මෙරට ඉන්නා කසිකබලුන්ට අල්තූසර්ගේ අර්ථයෙන්වත් අධිනිශ්චය යන්න නොවැටහෙන බව පැහැදිලි ය. නො එසේ නම් ඔවුහු මහගම සේකර අධිනිශ්චය වී ඇත ආදී විකාර

© Prof. Nalin De Silva

කතා නො කියති. අද සිංහලෙන් අධිනිශ්චය වී ඇත යන්න යොදාගැනෙන ආකාරය පිළිබඳ හැඟීමක් අල්තුසර්ට කල්තබා දැනගැනීමේ ක්‍රමයක් තිබිණි නම් ඔහු කිසි දිනෙක ඒ ඕවර්ඩිටර්මින්ඩ් නම් බංකොලොත් සංකල්පය නිර්මානය නොකරනු ඇත.

පසුගිය දා මැයි පෙළපාලි ගිය කම්කරුවන් කී දෙනකුට කම්කරු පංති හැඟීමක්, විඥානයක් වී ද? පංතිය ගැන තවදුරටත් කතාකිරීම අනවශ්‍ය වෙයි. මාක්ස්වාදයේ සංකල්ප ඔස්සේ ශ්‍රි ල නි පක්ෂය හඳුනාගැනීමට මාක්ස්වාදීන්ට නොහැකිවීම ගැන අපි පුදුමයටවත්, කණගාටුවටවත් පත්නොවෙමු. කෙසේවෙතත් ශ්‍රී ල නි පක්ෂයට පැවැත්මක් ඇත්තේ සිංහලත්වයේ පක්ෂය ලෙස මිස ඊනියා පංතියක පක්ෂයක් ලෙස නො වෙයි. එසේත් නැතහොත් බොරු ලිබරල් පක්ෂයක් ලෙස නො වෙයි. සිංහලත්වයට විරුද්ධව ගොස් ඒ පක්ෂයට කිසිම පැවැත්මක් නොමැති බව ද තේරුම්ගත යුතු ය.

අද ශ්‍රි ල නි පක්ෂය ක්‍රියාකරන්නේ මහජන පක්ෂය ලෙස මිස නිදහස් පක්ෂය ලෙස නො වෙයි. විජය කුමාරතුංග මහතා සිංහල බෞද්ධයකුවත් සිංහලත්වය ඇගයූ පුද්ගලයකුවත් නො වීය. ඔහු මහජන පක්ෂය බිහිකෙළේ එයට කලින් වකවානුවක බණ්ඩාරනායක යුවළගේ තවත් බෑණනුවකු වූ කුමාර රූපසිංහ මහතා ජනවේග කල්ලිය නිර්මානය කළ අයුරින් ය. මහජන පක්ෂයේ අරටුවේ වූයේ ජනවේග අදහස් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. මේ සියල්ල සිංහලත්වයට විරුද්ධ වූ අදහස් විය. බණ්ඩාරනායක දියණියන් හා සිංහල බෞද්ධයන් නොවූ බෑණාවරුන් ඔස්සේ ම ශ්‍රි ල නි පක්ෂය නැසීමට විජාතික බලවේග ක්‍රියාකිරීම පිළිබඳ ව ද අපි පුදුම නොවෙමු. එහෙත් කණගාටුවෙමු.

පණස්හයේ දරුවන් යනුවෙන් අප විසින් නිර්මානය කරන ලද සංකල්පය ජනතා විමුක්ති පෙරමුණට පමණක් සීමාකිරීමට ඇතැමුන් කටයුතුකිරීම කණගාටුදායක ය. සංකල්ප තේරුම් ගත යුත්තේ සංකල්ප ලෙස මිස විසුරුණු කවි සංකල්පනා ලෙස නො වෙයි. ජනතා විමුක්ති පෙරමුණෙන් බැහැරව ද පණස්හයේ දරුවෝ වෙති. පණස්හයේ දරුවන්ගෙන් ඉතා වැඩි ප්‍රමාණයක් තවමත් ඇත්තේ ශ්‍රි ල නි පක්ෂයෙහි බව අමතක නොකළ යුතු ය. අද ශ්‍රි ල නි පක්ෂයට ප්‍රශ්නය වී ඇත්තේ මේ පණස්හයේ දරුවන් තවදුරටත් පක්ෂයෙහි රඳවාගන්නේ කෙසේ ද යන්න ය.

ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණයට යම්කිසි අයුරකින් අත්සන් තැබුවහොත් ඒ සමග ශ්‍රී ල නි පක්ෂයේ ගමනක අවසානය ද සිදුවනු ඇත. උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී ඇති කොටි සංවිධානයට සුනාමිය ඔස්සේ පළාත් දෙකෙහිම ආණ්ඩුවට සම තත්ත්වයක් ලබාදීමට කටයුතුකිරීම සිංහලත්වය පාවාදීමක් බව ජනවේග කල්ලියේ හෝ මහජන පක්ෂයේ හෝ කල්මරා නොමැති (සොල්හයිම් වී නොමැති එනම් රස්තියාදු වී නොමැති) ඕනෑම ශ්‍රි ල නි පාක්ෂිකයකුට අවබෝධවනු ඇත. සිංහලත්වයේ පක්ෂයට සිංහලත්වය පාවා දී තවදුරටත් පැවැත්මක් නැත.

ඉන්දියාව මේ සම්බන්ධයෙන් යම් පියවරක් ගැනීමට සූදානම්වන බවක් පෙනෙයි. ඒ කුමක්දැයි අපට නිශ්චිතව ම කිවහැකි නො වෙයි. කුමාරතුංග මහත්මියට ඉන්දියාවට පැමිණීමට ආරාධනයක් ඇති බව සැල ය. ඒ කෙසේ වෙතත් සිංහලත්වය නැසීමේ බටහිරයන්ගේ කුමන්ත්‍රණ පරාජයකිරීමට සිංහලයන්ට හැකිවිය යුතු ය. අද ජනතා විමුක්ති පෙරමුණ යම් ජාතික මතවාදයකට එළඹ ඇත. එහෙත් මෙරට තවමත් ජාතික මතවාදවලින් සන්නද්ධ වූ සිංහලත්වයේ අයෝමය පක්ෂය බිහි වී නැත. ශ්‍රි ල නි පක්ෂය සිංහලත්වයේ පක්ෂය වුව ද එය ද තවමත් ජාතික මතවාද දෙසට අවශ්‍ය තරමට නැඹුරු වී නැත. විශේෂයෙන් ම ශ්‍රී ල නි පක්ෂයේ නායකත්වයට තවමත් ඇත්තේ ලිබරල් හා මාක්ස්වාදී මතවාදවල සරණ ය.

යම් අයුරකින් ඒකාබද්ධ යාන්ත්‍රණයට ජනාධිපතිනිය අත්සන් කළහොත් පක්ෂයේ සාමාජිකයන්, විශේෂයෙන් තරුණයන් ජනතා විමුක්ති පෙරමුණ දෙසට ඇදීයෑම වැළැක්විය හැකි නො වෙයි. ජනතා විමුක්ති පෙරමුණ මාක්ස්වාදයෙන් ගිලිහී නොමැති අවස්ථාවක එසේ වීම රටට හා ජාතියට වැඩදායක යැයි මම නො සිතමි. ඒකාබද්ධ යාන්ත්‍රණය ඔස්සේ හෝ වෙනත් අයුරකින් හෝ ශ්‍රි ල නි පක්ෂය මේ අවස්ථාවේ අවසන් ගමන්යෑම වැළැක්වීම පාක්ෂිකයන්ගේ වගකීම ය.

© Prof. Nalin De Silva